පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016/2017 (අප්‍රේල් 2017)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016/2017 (April 2017)

**19වන සියවස තෙක් සිංහල සාහිත්‍යය සහ නාට්‍යය**
**(Sinhala Literature and Drama up to the 19th Century)**
**SINE (102)**

**කාලය පැය තුනයි (03).**

**පළමුවන ප්‍රශ්නය** හා **හතරවැනි ප්‍රශ්නය ඇතුළත්ව,** ප්‍රශ්න පත්‍රයේ ඇති කොටස් තුනෙන් සැම කොටසකින්ම **එක් ප්‍රශ්නයක්වත්** ඇතුළත්වන සේ ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න. මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08). නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.

---

**I කොටස**

1. පහත සඳහන් ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියා ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ) එකල අඟුල්මල් සොර විස්මිත වැ "මම් පූර්වයෙහි
දිවෙන ඇතුන් ලුහුබැඳ ගණිම් ම යැ. අසුන් ලුහුබැඳ ගණිම්
ම යැ. රථ ලුහුබැඳ ගණිම් ම යැ. දිවෙන මුවන් ලුහුබැඳ ගණිම් ම යැ.
එතෙකුදු හොත් මම් මේ මහණහු පියවිගමනින් යන්නහු
බැල පමණින් දිවෙනුයෙම් හඹා නො ගත හෙමි" යි සිටැ බුදුනට
"සිට, සිට මහණ"යි කී ය. බුදුහු "මම සිටියෙමි. තොද සිට" යි
වදළෝ. එසඳැ අඟුල්මල්සොරහු 'මේ සැහැ මහණහු <u>සබච්</u>
කියති. මේ මහණ යනුයේ ම 'මම සිටියෙමි. තො ද සිට' යි
යෙයි. යම් කාරණයෙකින් මේ මහණ යනුයේ 'සිටියා'නම්
වේ ද, මම් සිටියෙමි. 'නො සිටියා' නම් වෙම් ද ඒ කාරණය
පිළිවිස බැලුව මැනැවැ"යි සිතා "මහණ, තෝ යන්නෙහි,
'සිටියෙමි' යි යෙහි. මා සිටියාහට 'නො සිටියාහ' යෙයි. තෝ
කිසේ සිටියෙහි? මම් කිසේ නො සිටියෙමි?" **<u>පිළිවිත්.</u>**

(**අමාවතුර**, කෝදාගොඩ ඥානාලෝක (සංස්), 134, 135 පිටු )

(ආ) චුල්ලතිස්ස තෙරුන් වහන්සේ නම් ශුද්ධෝදන රජ්ජුරුවන්
ගේ නැගණී කෙණෙකුන් ගේ පුතණුවන් වහන්සේ ය. ඔබ වැළි ත්
ගොයම් කළ මනා **<u>වක</u>** තබා පියා කල් පසු කොට කරණ ගොය
මක් සේ පිළිවෙත් පිරීමට යොග්‍ය වූ බාල අවස්ථාව ගිහි ගෙයි ම
රඳ වැඩි මාලු කල මහණ ව **<u>රූක්ෂ</u>** ප්‍රතිපත්ති නැමැති රළු පරළු
දෙය හැර බුදුන්ට උපන් මියුරු ආහාර සුව සේ වළඳ පිළිවෙතින්
සීන් වුව ත් මසින් ලෙයින් මහත් ව ඉස ත් බඩ ත් මහ ත් හෙයින්
චුල්ලතිස්ස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ ව මට සිලුටු වූ සීන්
සිවුරු වැළඳ පියා ආඪ්‍ය තරම් හඟවනු නිසා විහාර මධ්‍යයෙහි බො
හෝ තැන් රැස් වන හෙයින් උස් ව තිබෙන හස්නකට නැඟී පියා
බොහෝ සේ හිඳනා සේක.

(**සද්ධර්මරත්නාවලිය**, කිරිඇල්ලේ ඥානවිමල (සංස්), 93 පිටුව)

(ඇ) පයඝ්‍රප්ති නම් ත්‍රිපිටකබුද්ධවචනයෙහි පාඨ හා **අර්ථකතා**
යම්තාක් කලැ වැටේ ද ඒතාක් කල් පයඝ්‍රප්ති පරිපූණි නම් වෙයි.
කල් යත් යත් කලියුගයෙහි රජහු අධර්මික වෙති. ඔවුන්
අධාර්මිකවූ කලැ රාජාමාත්‍යාදීහු අධාර්මික වෙති. ඔවුන් බලා
රටවැස්සෝද ජනව්වැස්සෝද අධාර්මික වෙති. ඔවුන්ගේ
අධාර්මිකතායෙන් දෙව සම්‍යග්වර්ෂණ නොකෙරෙයි.
සම්‍යග්වර්ෂණ නොකරන්නා හා ශස්‍යයෝ **සම්පන්න** නොවෙති.
ශස්‍යයන් අසම්පන්නවන්නා හා ප්‍රත්‍යයදායකයෝ භික්‍ෂු
සඞ්ඝයාහට ප්‍රත්‍යය දනයට අසමර්ථ වෙති.

(**ධර්මප්‍රදීපිකාව**, බද්දේගම විමලවංස (සංස්), 338 පිටුව)

(ලකුණු 30)

2. "**අමාවතුරෙහි** විද්‍යමාන බුදු සිරිත, සැදැහැබැතියත් විචාරයත් සම්මිශ්‍රිත අවබෝධ මාර්ගයකි." විමසන්න.

3. **සද්ධර්මරත්නාවලී** කතුවරයා ළාමක මිනිස් චරිත පිළිබඳ තියුණු උපහාසයෙනුත් පාපතර චරිත පිළිබඳ දැඩිතර සංවේගයෙනුත් හැඟුම් පෙළ ගැසූ ආකාරය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

## II කොටස

4. (අ) පහත දැක්වෙන සීගිරි ගී ලිහිල් බසින් ලියන්න.

ස්වස්ති
[නැ]ගි අලුයම අවුජ් බලය් සිටියිනි මෙහි මය්
වින්දිමි මන්දමරු ගස එත තමු(රු) වෙනෙහි
සුවන්ද් (මෙහි)

සිතහි යහපත විද බලය (මෙහි) රනවනබුන
බලත නොමෙ ජතුමහ සිත ජතුමහ මෙ සිහි වන ක(ල)

අ[ද]නෙ සිත ම කත මෙ මෙහි නො[මෙ] බිණි විද තෙපුල්
සිත අදනු බණ[නා] බන්දු [මහනෙල්] ගෙනැ ඇති හෙයින්

නෙගි බෙයන්ද් බලමිනි මෙදෙසෙ සිතියම ජන සිටි
තොප මෙදෙස අසලින් මෙය අද[ෙ]බලි වෙ යහ
[ස]බන්දි[නි]

හින්දි මෙ(සි)ත් හෙජුයු (හි)ම(ම්බි)න් (වී) තබන් දනො
(නොපෙ)නී හෙජී ගිය (මා) හින්දින්නො මින්දිබියො

(නන්දසේන මුදියන්සේ, **සීගිරි ගී**, 7-8, පිටු)

(ආ) "සීගිරි ගී යනු ශත වර්ෂ කිහිපයක් තුළ පරිණාමය වූ, විවිධ සමාජ ස්තර පිළිබඳ බොහෝ තතු කියැවෙන නිර්මාණ විශේෂයකි." සමාලෝචනයකට ලක් කරන්න.

(ලකුණු 25)

5. **කව්සිළුමිණේ** එන නිශා වර්ණනයෙහි චමත්කාරය පිළිබඳ විවරණයක යෙදෙන්න.

6. **"ගුත්තිල කාව්‍යයෙන්** ප්‍රකට වන්නේ මනුෂ්‍යත්වයෙහි උතුම් බව හා අධම බව අතර වෙනසකි." පක්ෂව හෝ විපක්ෂව අදහස් දක්වන්න.

## III කොටස

7. ගැමි ශාන්ති කර්මවල අවධාරණය වන සමාරෝපය නම් සංකල්පය විස්තර කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතරින් **තුනකට (03)** කෙටි සටහන් ලියන්න.

   i. රට යකුම

   ii. කෝලම්

   iii. සොකරි

   iv. කවි නාඩගම්

(01 හා 04 යන ප්‍රශ්න හැර අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 15 බැගිනි.)